## 2556 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2011 (2012)

### (04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය

**S 4**

(ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.)

### II කොටස

2. (i) සංසාර විමුක්තිය ලැබීම ආශ්‍රිතව බුදු දහමෙහි ඉගැන්වෙන 'ත්‍රිවිධ යාන' හඳුන්වා, ඒවා පිළිබඳ ව මහායානිකයන් දරන මතය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

   (ii) මහායාන බුදු දහමෙහි බෝධිසත්ත්ව වන්දනාවට විශේෂ ස්ථානයක් හිමි වී ඇති ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

   (iii) ධ්‍යානී බෝධිසත්ත්වවරුන් ගැන හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

3. (i) ධර්මාශෝක අධිරාජයා ධර්මප්‍රචාරය සඳහා යොදාගත් උපාය මාර්ග පිළිබඳ විශ්ලේෂණයක් කරන්න. *(ලකුණු 06 යි)*

   (ii) එම අධිරාජයා ධර්මප්‍රචාරය සඳහා තෝරාගත් රටවල් **හයක්** හා ඒවාට යැවූ ධර්මදූතයන්ගේ නම් දක්වන්න. *(ලකුණු 06 යි)*

   (iii) එම අධිරාජයාගේ අනුග්‍රාහකත්වයෙන් පැවැත්වූ ධර්ම සංගීතියේ ප්‍රතිඵල කවරේදැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

4. (i) භාරතයේ වලභී විශ්ව විද්‍යාලයේ ආරම්භය පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

   (ii) එම විශ්ව විද්‍යාලයේ ඉගැන්වූ විෂය මාලාව හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

   (iii) එම විශ්ව විද්‍යාලය ගැන විදේශීය සංචාරකයින්ගේ වාර්තාවල ඇතුළත් කරුණු ගැන සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

5. (i) ඓතිහාසික මූලාශ්‍ර අනුව ජෛනාගම ශ්‍රී ලංකාවේ පැතිර ගිය බවට දැක්විය හැකි සාධක කවරේදැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

   (ii) ප්‍රාග් බෞද්ධ යුගයේ දී ශ්‍රී ලංකාවේ පැතිර ගිය යක්ෂ ඇදහිලි ගැන විශ්ලේෂණයක් කරන්න. *(ලකුණු 06 යි)*

   (iii) මහින්දාගමනය නිසා ශ්‍රී ලංකාවට ලැබුණු උත්කෘෂ්ට දායාද කවරේදැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

6. (i) වෘක්ෂ වන්දනාව ද, දෙවියන් හා ප්‍රේතයන් පිළිබඳ විශ්වාස ද පැතිර ගිය ශ්‍රී ලාංකික සමාජය බුදු දහම කෙරෙහි යොමු කරවීම සඳහා මිහිඳු හිමියන් උපයෝගී කොටගත් ක්‍රමෝපාය ගැන විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

   (ii) පංචසීල ප්‍රතිපත්තියට මුල් තැන දුන් දැහැමි සමාජයක් ගොඩ නැංවීම උදෙසා ඇතැම් පැරණි ශ්‍රී ලාංකේය රජදරුවන් අනුගමනය කළ ක්‍රියා මාර්ග කවරේදැ'යි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

   (iii) දුටුගැමුණු කුමාරයාගේ රාජ්‍ය පදප්‍රාප්තිය මෙරට ස්වෛරීභාවය ආරක්ෂා කිරීමට මෙන් ම ශාසනයේ චිරස්ථිතිය සඳහා ද හේතු වූ ආකාරය විභාග කරන්න. *(ලකුණු 06 යි)*

7. (i) "ශ්‍රී ලංකා රාජ්‍ය පාලනය බෞද්ධ රජදරුවන්ට ම අයත් විය යුතුය" යන සංකල්පය මෙරට මුල් බැස ගැනීමට හේතු වූ කරුණු නිදසුන් මගින් පිරික්සන්න. *(ලකුණු 06 යි)*

   (ii) "ශ්‍රී ලාංකේය රජදරුවන් බොහෝ විට බුද්ධ ශාසනයේ දියුණුවට හා ආරක්ෂාවට ක්‍රියා කළ අතර ස්වකීය ආරක්ෂාවට ද ශාසනය උපයෝගී කර ගත් බව පෙනේ." මෙබඳු නරපතියන්ගේ ක්‍රියාකාරිත්වය ඇසුරින් මේ අදහස ගැන සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

   (iii) සතර අගතියෙන් තොරව දශරාජ ධර්මයෙහි හැසිරෙමින් සිවුසඟරාවතින් යුතුව මහජනතාවට සංග්‍රහ කිරීමට ප්‍රයත්න දැරූ ශ්‍රී ලාංකේය රජුන් පිළිබඳ විමසීමක් කරන්න. *(ලකුණු 06 යි)*

8. (i) ශ්‍රී ලංකාවේ නිර්මිත බුදුපිළිමවලින් නිරූපිත ඉරියව් හඳුන්වා දෙමින්, එයින් එක් පිළිම වර්ගයක් තෝරා ගෙන ඒවා පිහිටි ස්ථාන ගැන තොරතුරු සපයන්න. *(ලකුණු 06 යි)*

   (ii) ශ්‍රී ලංකාවේ බුදුපිළිමවල දක්නට ලැබෙන මුද්‍රා පිළිබඳ විමර්ශනයක් කරන්න. *(ලකුණු 06 යි)*

   (iii) තිවංක බුදුපිළිම කවරේ දැයි හඳුන්වා, ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන මෙබඳු පිළිම ගැන විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

* * *

Scanned by CamScanner